# බයිබල් දැනුම මිනුම තරඟය - 2026 සිට

## තේමාව : මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ



## කාණ්ඩය : 4 හා 5 ශ්‍රේණි

ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

## බයිබල් දැනුම මිනුම තරගය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

### 4 ශ්‍රේණිය - තේමාව : මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ

| පොදු අරමුණ | ප්‍රධාන බයිබල් පාඨ | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| මැවීමේ කථාව | උත්පත්ති 1-2 පරිච්ඡේද | දෙවියන් වහන්සේ ආදරණීය මැවුම්කරු බව දකිමින් කථාන්දරය නැවත කියයි. | ගීතාවලිය 24:1<br>ගීතාවලිය 104:24<br>එළිදරව්ව 4:11 | දරුවා දෙවියන් වහන්සේගේ බලය හා යහපත්කම මැවිල්ල තුළින් දකින්නට හුරුවෙයි. |
| ජේසුස් වහන්සේගේ උපත | ශු. ලූක් 2:1-20 | ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ දුන් ශ්‍රේෂ්ඨතම ත්‍යාගය බව දැනගනියි. | යෙසායා 9:6<br>ශු. මතෙව් 1:21<br>ගලාති 4:4 | දරුවා මැවුම්කරුවාණන්ගේ ප්‍රේමය උන්වහන්සේගේ පුත්‍රයාගේ උපත හා සම්බන්ධ කරයි. |
| විශ්වාස ලක්ෂණය 1 හා 2 වගන්ති | අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය | දෙවියන් වහන්සේ මැවුම්කරුවාණන් බවත් ජේසුස් වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණන් බවත් විශ්වාසයෙන් ප්‍රකාශ කරයි. | හෙබ්‍රෙව් 11:3<br>ජොහාන් 1:3<br>ජොහාන් 3:16 | දරුවා මැවීම හා ගැලවීම සම්බන්ධ ඇදහිලි සම්බන්ධ කරයි. |
| සක්‍රමේන්තු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ | 1 කොරින්ති 10:16-21<br>ජොහාන් 6:51<br>ශු. ලූක් 2:1-20 | දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජේසුස් වහන්සේගේ සැබෑ ජීවමාන වැඩසිටීම ඇති බව තේරුම් ගනියි. | ශු. මතෙව් 28:20<br>ජොහාන් 6:35<br>ශු. ලූක් 22:19 | දරුවා දෙවියන් වහන්සේගේ තිලිනය සක්‍රමේන්තුව තුළ අඛණ්ඩව පවතින බව දැන ගැනීම. |
| යාච්ඤාව හා ප්‍රශංසාවේ යැදුම | ගීතාවලිය 148 | එතුමන්ගේ ක්‍රියාවන් වෙන්වෙන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ගීතාවලිය 148 ගීතය උච්චාරණය කරයි. | ගීතාවලිය 150:6<br>ගීතාවලිය 8:1<br>ගීතාවලිය 100:1 | දරුවාට කෘතඥාවය හා වන්දනාව සඳහා මග පෙන්වයිග |



## බයිබල් දැනුම මිනුම තරගය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

## 5 ශ්‍රේණිය - තේමාව : මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| මිනිසාගේ වැටීම | උත්පත්ති 3-4 පරිච්ඡේද | පාපයේ ඇතුල්වීම හා දේව කරුණාව පිළිබඳව දැනගැනීම. | රෝම 3:23 ගීතාවලිය 103:8 ජොහාන් 1:29 | දරුවන් ගැලවීමේ අවශ්‍යතාවය හා දෙවියන් වහන්සේගේ ප්‍රේමය පෙන්වයි. |
| ගැලවුම්කරුවාණන්ගේ පොරොන්දුව | ජොහාන් 3:16 | තම පුත්‍රයාණන් එවීම තුළ දේව ආදරය දරුවා දැනගනියි. | ජොහාන් 8:12 රෝම 5:8 යෙසායා 7:14 | දරුවන් ගැලවීම හා බලාපොරොත්තුවේ දෙවියන් වහන්සේගේ පොරොන්දු පිළිබඳ අධ්‍යනය කරයි. |
| විශ්වාස ලක්ෂණයේ වගන්ති | අපොස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය | පව් සමාව හා සදාකාලික ජීවිතය. | ලූක් 7:48 ජොහාන් 11:25 ගීතාවලිය 103:12 | දරුවන් විශ්වාසය හා පව්සමාව තුළ සදාතන ජීවිතයට සම්බන්ධ කරන බව දැනගැනීම. |
| පාපොච්චාරණය නොහොත් සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය | ජොහාන් 20:19-23 | පාපොච්චාරනය කිරීම තුළින් දෙවියන් වහන්සේගෙන් අපට පව් සමාව ලැබෙන බව අධ්‍යනය කරමින් පාපොච්චාරණයේ පියවරයන් ඉගෙන ගනියි. | 1 ජොහාන් 1:8-10 යෙසායා 1:18 මතෙව් 5:7 | දරුවන් දෙවියන් වහන්සේගේ කරුණාව තුළින් අපව පාපයෙන් නිදහස් කරන බව අත්දකියි. |
| සමාව දීමේ යැදුම | ගීතාවලිය 51 වන ගීතය | දාවිත් මෙන් දේව කරුණාව වෙනුවෙන් යාච්ඤා කරන්න. | ගීතාවලිය 34:18 පිලිප් 4:6 ලූක් 15:7 | පසුතැවීම තුළින් නව ජීවිතයකට මඟ පෙන්වන බව දරුවා ඉගෙන ගනියි. |



## 4 ශ්‍රේණිය - තේමාව : මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ

### 1. පොදු අරමුණු

- ❖ ලෝකයේ හා එක් එක් පුද්ගලයාගේ ප්‍රේමණීය ගැලවුම්කරුවණන් ලෙස දෙවියන් වහන්සේව සොයා ගැනීමට දරුවන්ට උදවු කරයි.
- ❖ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් ද, ගැලවුම්කරුවාණන් ද, දේව ආදරයේ තිලිනයක් ද වන බව හඳුන්වා දෙයි.
- ❖ දිව්‍ය සත්ප්‍රසාදය තුල ජේසුස් වහන්සේ අප වෙනුවෙන් ජීවමානව වැඩසිටින බව හඳුනාගැනීමට මග පෙන්වයි.
- ❖ මුලු මැවිල්ල හා සමග සම්බන්ධ වෙමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට දරුවන් දිරිමත් කරයි.

### 2. ධර්මෝපදේශයේ මූලික කුළුනු හතරට අනුව:

**I. ශුද්ධ ලියවිල්ල - දේව වචනය**

තේමා පරිච්ඡේදය : උත්පත්ති 1-2 (මැවීමේ කතාව)

- ◆ දින හයකින් ලෝකය මැවීම
- ◆ දේව සමානකමට (ස්වරූපයට) පුරුෂයා හා ස්ත්‍රිය මැවීම
- ◆ දෙවියන් වහන්සේ හත්වන දිනට ආසිරි පතා එය ශුද්ධ දවසක් ලෙස වෙන් කිරීම



උපකාරක පරිච්ඡේද (නව ගිවිසුම) ශු. ලූක් 2 පරිච්ඡේදය

- ● දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත බෙත්ලෙහෙමේ දී සිදුවීම.
- ● දේවදූතයන් හා එඬේරුන් විසින් මැවුම්කාර දෙවිඳුන් මහිමයට පත් කිරීම.

ඉගෙනුම් ඵල

- ● දරුවන්ට දිනෙන් දින ලෝකය මැවූ කථාව නැවත කීමට හැකි වීම.
- ● මැවුම්කරු වන දෙවියන් වහන්සේ ජේසුස් නම් තම පුතනුවන්ගේ උපත තුළින් මැවිල්ලට ඇතුලත් වන බව හඳුනා ගනියි.
- ● ස්වභාව ධර්මය තුලින් හා මිනිස් ජීවිත තුලින් දෙවියන් වහන්සේගේ යහපත් කම දැකීමට පටන් ගනී.

**II. ඇදහිල්ලේ ප්‍රකාශනය (විශ්වාස ලක්ෂණය)**

**අන්තර්ගතය**: අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය - 1 හා 2 වගන්ති

1. අහස හා පොළොව මැවූ සර්ව බලධාරී දෙවියන් වහන්සේ ගැන මම විශ්වාස කරමි.
2. උන්වහන්සේගේ ඒක පුත්‍ර වූ අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි.

ඉගෙනුම් ඵල

- ● දෙවියන් වහන්සේ මැවුම්කරුවාණන් බවත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ එකම පුත්‍රයා බවත් සරල බසින් දරුවා උච්චාරණය කරයි.
- ● "මම විශ්වාස කරමි" යන වගන්තිය සමස්ත සභාව සමග කරන ප්‍රකාශනයක් බව හඳුනා ගනියි.

**III. සක්‍රමේන්තු - ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිතය**

**අන්තර්ගතය**: දිව්‍ය සත්ප්‍රසාදය

- ● 1 කොරින්ති 10:16-21 - ''දිව්‍ය සත්ප්‍රසාදය යනු ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බෙදා ගැනීම'' බව
- ● ජොහාන් 6:51-56 - "ජීවනයේ ආහාරය ජේසුස් වහන්සෙ'' බව

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම සම්බන්ධ සටහන් :

- ● මතෙව් 26:26-29, මාර්ක් 14:22-25, ලූක් 22:14-20

ඉගෙනුම් ඵල
- මැවීමේ සම්බන්ධතාවය (දෙවියන් වහන්සේගෙන් ලද ජීවන තිළිනය) ජේසුස් වහන්සේ, (දෙවියන් වහන්සේගේ ආදර තිළිනය) දිව්‍ය සත්ප්‍රසාදය, (දෙවියන් වහන්සේ විසින් තමන් වහන්සේවම තිළිනයක් ලෙස)
- දිව්‍ය පූජාව යනු ජේසුස් වහන්සේගේම ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය නම් තිළිනය සැමරීමක් බව හඳුනා ගනී

**VI. යාච්ඤාව - ප්‍රශංසාවේ ජීවිතය**

**අන්තර්ගතය** - ගීතාවලිය 148 - මැවිල්ලේ ප්‍රශංසා ගීතය
- අහස, පොළව, සත්තු, ගස් හා මිනිසුන් මැවුම්කරුවාණන්ට පැසසුම් කරයි.



ඉගෙනුම් ඵල
- ගීතාවලිය 148 තුළින් තෝරාගත් පාඨයන් දරුවන් විසින් කටපාඩමින් ඉගෙනගනු ලබයි .
- දරුවන් විසින් තමන්ගේම වචන වලින් කුඩා ප්‍රශංසා යැදුමක් නිර්මාණය කරයි.

## 3. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝජනා

- කථාන්දර ආකාරයෙන් - මැවීමේ කථාව, ජේසුස් වහන්සේගේ උපතේ කථාව, අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය කථාව
- දෘශ්‍යාධාර - මැවීමේ චක්‍රය, ක්‍රිස්තුඋත්පත්තියේ චාට්, දිව්‍ය සත්ප්‍රසාද සංකේත
- රංගනය සමඟ ගායනය - මැවීම, විශ්වාස ලක්ෂණය හා ගීතාවලිය 148 සම්බන්ධයෙන්
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් - මැවීමේ අවස්ථාවන් චිත්‍රයට නැඟීම, කිතු උපත නාට්‍ය ආකාරයෙන් ඉදිරිපත් කිරීම, ප්‍රශංසාවේ යැදුමක් එක් වාක්‍යයකින් ලිවීම

## 4. තක්සේරුව හා ඇගයීම

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත | බහු වරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු සැපයීම | 40 |
| කටපාඩම් පද | ගීතාවලිය 148 හෝ විශ්වාස ලක්ෂණයේ පාඨ | 20 |
| කථික හෝ චිත්‍ර | මැවීම හා උපත | 20 |
| අවබෝධය | මැවීම හා දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ වාචික ප්‍රශ්න ඇසීම | 20 |

**සම්මාන ප්‍රධානය**

- රන් - 85 - 100
- රිදී - 70 - 84
- ලෝකඩ - 50 - 69
- සහතිකපත්‍ර - 50 අඩු

## 5. 4 ශ්‍රේණිය අවසානයේ දී අපේක්ෂිත ප්‍රතිඵල

- බයිබලයේ මැවීමේ හා ක්‍රිස්තෝත්පත්ති කථා පිළිබඳඅවබෝධය ඇති කිරීම
- මැවුම්කරු දෙවියන් වහන්සේ හා ඔහුගේ පුත්‍රයා වන ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය ප්‍රකාශ කිරීමේ හැකියාවන් ඇති කිරීම
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු ජේසුස් වහන්සේ පිළිබඳ මූලිකවම තමාව තිළිණයක් කොට ලබා ගැනීම බව තෙරුම් කරවීම
- ශු. ලියවිල්ල තුළ හා පෞද්ගලික යාච්ඤාව තුළින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමේ පුරුද්ද ඇති කිරීම.

## 5 ශ්‍රේණිය - තේමාව : මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ

### 1. පොදු අරමුණු

- ❖ මනුෂ්‍ය වර්ගයා සඳහා දෙවියන් වහන්සේගේ මැවීම වැටීම ගැලවීමේ පොරොන්දුව දරුවන්ට තේරුම් ගැනීමට උදව් කරයි.
- ❖ දෙවියන් වහන්සේ විසින් (මැවුම්කරු) පොරොන්දු වූ ගැලවුම්කරුවාණන් ලෙසින් ජේසුස් වහන්සේව හඳුනා ගනියි.
- ❖ පාපොච්චාරණය නමැති සක්‍රමේන්තුව දෙවියන් වහන්සේගේ කරුණාවෙන් ලද තිළිණයක් ලෙස අගය කරයි.
- ❖ ගීතවලිය 51 හි දක්වෙන දාවිත් රජු ගේ පව් සමාව ලබා ගැනීම සඳහා යාච්ඤා කිරීමට ඉගෙන ගනියි.

### 2. ධර්මෝපදේශයේ මූලික කුළුනු හතරට අනුව:



**I. ශුද්ධ ලියවිල්ල - දේව වචනය**

පැරණි ගිවිසුම (උත්පත්ති 3-4 පරිච්ඡේද)

- ආදම් හා ඒවගේ වැටීම - පාපය ලෝකයට ඇතුළු වේ.
- කායින් හා ආබෙල් - පාපයේ ප්‍රථිවිපාක දෙවියන් වහන්සේගේ යුක්තිසහගත බව හා දයා කරුණාව.

නව ගිවිසුම (ජොහාන් 3:16-18)

- ''දෙවියන් වහන්සේ ලෝකයාට කෙතරම් ප්‍රේම කළ සේක්ද කීවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන්ව ද ලොවට එවා වදාල සේක ....''
- ''ජේසුස් වහන්සේ තුළින් ඉටුවූ දෙවියන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව

ඉගෙනුම් ඵල

- දරුවන්ට වැටීම පිළිබඳ කථාව ද එමඟින් ඇති වූ ප්‍රථිවිලාක ද පැහැදිලි කරයි.
- දෙවියන් වහන්සේගේ ප්‍රේමය හා පොරොන්දුව ජේසුස් වහන්සේ තුළින් මනුෂ්‍ය වර්ගයා බේරා ගැනීම බව පැහැදිලි කරයි.

**II. ඇදහිල්ලේ ප්‍රකාශනය (විශ්වාස ලක්ෂණය)**

**අන්තර්ගතය**: අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය - 11 හා 12 වගන්ති

11 වන වගන්තිය - ''මම පව් කමාව ගැන විශ්වාස කරමි.''

12 වන වගන්තිය - ''මම සදාකාල ජීවිතය කෙරෙහි විශ්වාස කරමි.''

ඉගෙනුම් ඵල

- පාපය, සමාවදීම හා සදාකාල ජීවිතය අතර සම්බන්ධතාවයක් ඇති බව දරුවන් තේරුම් ගනියි.
- දරුවන් නැවත උච්චාරණය කර සරල වචන වලින් පැහැදිලි කරයි.

**III.සක්‍රමේන්තු - ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිතය**

**අන්තර්ගතය**: සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය (පාපොච්චාරණය)

- ජොහාන් 20:23 - ''ඔබ යමෙකුගේ පව් කමා කරන්නහු ද, ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ. ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නහු ද, ඒවා කමා නොකරනු ලැබේ.''

ඉගෙනුම් ඵල

- සමගිවීමේ ප්‍රසාද නිධානය තුළින් දේව දයාව (කරුණාව) ලැබෙන බව හඳුනා ගනියි.
- යහපත් පාපොච්චාරණයක් සඳහා මූලික පියවරයන් හඳුනා ගනියි. (පවු මතක් කර ගැනීම, පසුතැවීම, පාපොච්චාරණය, දඬුවම් ඉෂ්ඨ කිරීම, නැවත පව් නොකිරීමට සිතා ගැනීම)

**VI. යාච්ඤාව - පසුතැවීම හා ප්‍රශංසා කරීමේ ජීවිතය**

**අන්තර්ගතය** - ගීතාවලිය 51 - පව් සමාව සඳහා යැදුම

- දාවිත් රජු පව් කිරීමෙන් පසු පසුතැවීම සඳහා කළ යාච්ඤාව.



**ඉගෙනුම් ඵල**

- ගීතාවලියේ 51 වන ගීතයෙන් තෝරාගත් පද කටපාඩමින් කියයි.
- සමාව ඉල්ලා කෙටි යාච්ඤාවක් නිර්මාණය කරයි.

## 3. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝජනා

- කථාන්දර ආකාරයෙන් - මිනිසාගේ වැටීම, කායින් ආබෙල් කථාව, ගැලවීමේ පොරොන්දුව
- දෘශ්‍යාධාර - ඒදන් උයනේ ආදම් හා ඒව, ජොහාන් 3:16හි සංකේතවත් කරමින් කුරුසය (ඒක ජාතක පුත්‍රයාණන් එවා වදාල සේක), පාපොච්චාරණය කරන දසුනක්
- රංගනය සමඟ ගායනය - දේව ආදරය, කමාව යැදීමේ තේමාවන් යටතේ
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් - පසුතැවීමට පෙර හා පසු අවස්ථා චිත්‍රයට නැඟීම, ගීතාවලිය 51 හි ආකාරයට පෞද්ගලික යාච්ඤාවක් රචනා කිරීම, නාට්‍ය නිරූපනය (පියතුමා හා පසුතැවිලි වන පුද්ගලයා)

## 4. තක්සේරුව හා ඇගයීම

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත | බහු වරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු සැපයීම | 40 |
| කටපාඩම් පද | ගීතාවලිය 51 හෝ විශ්වාස ලක්ෂණයේ පාඨ | 20 |
| කථික හෝ චිත්‍ර | මැවීම හා ගැලවුම්කරුවාණන්ගේ උපත | 20 |
| අවබෝධය | මැවීම හා පාපොච්චාරණය පිළිබඳ වාචික ප්‍රශ්න ඇසීම | 20 |

**සම්මාන ප්‍රධානය**

- රන් - 85-100
- රිදී - 70-84
- ලෝකඩ - 50-69
- සහතික ප්‍රධානය - 50 ට අඩු

## 4. 5 ශ්‍රේණිය අවසානයේ දී අපේක්ෂිත ප්‍රතිඵල

- උත්පත්ති 3-4 පරිච්ඡේද වල මඟපෙන්වීමෙන් පාපයේ හා පාපයේ ප්‍රතිවිපාක තේරුම් ගනියි.
- ජේසුස් වහන්සේ ගැලවුම්කරුවාණන් ලෙස ජේසුස් වහන්සේ ගැන මූලික දැනුම ලබා ගනියි.
- සමඟවීමේ ප්‍රසාද නිධානය හා දෙවියන් වහන්සේ සමඟ නැවත සමඟිවීම.
- ගීතාවලිය 51 ගීතය තුළින් පව් සමාව සඳහා යාච්ඤාවේ අත්දැකීම ලබයි.